**සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතය - 2019**

---

**1.1 තත්ත්වාගණනය කළ මතය**

---

**සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමේ ("සමාගම") සහ සමාගමේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන් හි ("සමූහය") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1 ) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සමාගමේ සහ සමූහයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.**

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

**මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

---

**මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර) අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

**මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.**

**සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.**

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5** මූල්‍ය ප්‍රකාශන

**1.5.1** කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්ව සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(කු ම ප අ සඳහා ශ්‍රී ලං මූ වා ප්‍ර)

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙහෙයුම් මුදල් ප්‍රවාහ ලෙස හඳුනා ගැනීම වෙනුවට දැන්වීම් නියෝජිතයන්ගෙන්, පදික වෙළඳුන්ගෙන්, බෙදාහැරීමේ නියෝජිතයන්ගෙන් ආදී වශයෙන් ලද මෙහෙයුම් තැන්පතු රු.1,536,516 ක් ආයෝජන මාර්ගයෙන් ලද මුදල් ප්‍රවාහ ලෙස හඳුනාගෙන තිබුණි. | සටහන් කර ගන්නා ලදී. 2020 වසරේදී මෙම තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | ප්‍රමිතියට අනුකූල වන පරිදි මුදල් ප්‍රවාහ පිළියෙල කළ යුතුය. |
| (ආ) තත්‍ය කුලී ආදායම්වලින් ලද මුදල් ප්‍රවාහය වූ රු.89,099,000 ක වටිනාකම රු.106,902,000 ක් ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආයෝජන මුදල් ප්‍රවාහය රු.17,803,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. 2020 වසරේදී මෙම තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | තත්‍ය මුදල් ප්‍රවාහ මුදල් ගලා ඒම් ලෙස සැලකිය යුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) මූල්‍ය වියදම්වලට අදාළ තත්‍ය මුදල් ගලායාම වූ රු.**95,668,000** ක වටිනාකම රු.**101,151,000** ක් ලෙස වාර්තා කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් රු.**5,483,000** කින් මෙහෙයුම් මුදල් ප්‍රවාහය වැඩියෙන් දක්වා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. **2020** වසරේදී මෙම තාක්ෂණික දෝෂ නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | තත්‍ය මුදල් ප්‍රවාහ මුදල් ගලායාම් ලෙස සැලකිය යුතුය. |
| (ඈ) ප්‍රමිතියේ **17.19** වගන්තිය පරිදි වත්කම්වල ඵලදායි ආයු කාලය අවම වශයෙන් මුදල් වර්ෂයක් අවසානයේදී සමාලෝචනය කළයුතු අතර අපේක්ෂාකිරීම් පෙර ඇස්තමේන්තුවලින් වෙනස්වන්නේ නම්, එම වෙනස්කම් කු ම ප අ සඳහා ශ්‍රී ලං මු වා ප්‍ර **10.15 – 10.18** වගන්තීන්ට අනුකූලව ගිණුම්ගත කළ යුතුය. කෙසේවුවද, රු.**1,307,274,937** ක් වූ තවදුරටත් භාවිතා කරන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල පිරියත සහ උපකරණ එපරිදි සමාලෝචනයක් හෝ ගිණුම්ගත කිරීමක් කර නොතිබුණි. | **2020** වසර තුළදී සමාගම දේපල පිරියත හා උපකරණවල ඵලදායි ආර්ථික ජීවකාලය සමාලෝචනය කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවුව ද, රට තුළ පවත්නා කොවිඩ් **19** තත්ත්වයේ ප්‍රතිඵලයක් වශයෙන් මෙය ඉදිරි වසරවලදී සිදුකරනු ලබන අතර මෙම වර්ෂය ඇතුළත දී මූලික කටයුතු සිදුකරනු ඇත. | ප්‍රමිතියේ මාර්ගෝපදේශයන්ට අනුගත විය යුතුය. |
| (ඉ) නීති දෙපාර්තමේන්තුවේ උපදෙස් ලබා ගැනීමකින් තොරව සමාගම සෑම වසරකදීම අසම්භාව්‍ය වගකීම් වෙනුවෙන් රු.**20,000,000** ක ස්ථාවර වෙන්කිරීමක් සමාගමට එරෙහිව පවතින නඩු කටයුතු සඳහා වෙන්කර තිබුණි. | නඩු කටයුතු සඳහා වෙන්කිරීමේදී වඩා සුදුසුම ඇස්තමේන්තුව මැන ක්‍රියාත්මක කර ඇත. | අසම්භාව්‍ය වගකීම් සඳහා යථාරූපී වෙන්කිරීමක් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගත යුතුව ඇත. |

**1.5.2** ගිණුම්කරණ දෝෂ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2019** දෙසැම්බර් **31** දිනට තොග අයිතම් **28** කට අදාළව භෞතික තොග ශේෂ වටිනාකම සහ ලෙජර ශේෂ වටිනාකම පිළිවෙලින් රු.**175,698,448** ක් සහ රු.**184,190,088** ක් විය. | භෞතික තොගයට වඩා ඉහළ අගයන් පෙන්නුම් කළ ලෙජර ශේෂ වටිනාකම් සඳහා හේතු තොග සැසඳුම් පිළියෙල කිරීමේදි හඳුනාගෙන ඇති අතර **2020** | භෞතිකව සත්‍යාපනය කරන ලද ශේෂය අවසාන තොගය ලෙස සැලකිය යුතු අතර වියදම්, තොග වශයෙන් හඳුනා නොගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කෙසේවුවද, රු.8,491,640 න් වැඩියෙන් දක්වමින් ලෙජර ශේෂය අවසාන තොගය ලෙස ගෙන තිබුණි. තවද, නඩත්තු වියදම් රු.1,427,337 ක් අවසාන තොගය ලෙස හඳුනාගෙන තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් අලාභය රු.9,918,977 න් අඩුවෙන් දක්වා තිබුණි. | වර්ෂය තුළ ගැළපුම් සඳහා ජ'නල් සටහන් නිකුත්කරනු ඇත. | |
| (ආ) | බැංකු ගිණුමට බැර කිරීම වෙනුවට සමාගම මාස තුනේ සිට අවුරුදු හය දක්වා වූ රු.1,428,663 ක චෙක්පත් ණයහිමියන්ගේ ගිණුම හරකර අතැති මූල්‍ය උපකරණ ගිණුම බැරකර රඳවාගෙන තිබුණි. | ගිණුම්කරණ පද්ධතියේ තාක්ෂණික දෝෂ හේතුවෙන් අදාළ ගෙවීම් චෙක්පත් නිකුත් කිරීමට / පිළියෙල කිරීමට අපට හැකියාවක් නොමැත. යම්කිසි කාලයක් දක්වා එම ණයහිමි ශේෂ මූල ප්‍රකාශනයන් හි පෙන්නුම් කෙරේ. | චෙක්පතක් නිකුත්කරන විට, එය බැංකු ගිණුමට බැර කළ යුතුය. |
| (ඇ) | රු.540,340,311 ක් වටිනා ණයගැතියන්ගෙන් ශේෂ සනාථ කිරීම් කැඳවා තිබුණ ද, 2020 ජුනි 17 දින වන විට රු.21,824,446 ක් වටිනා ණයගැතියන් 38 ක් පමණක් ප්‍රතිචාර දක්වා තිබුණු අතර ඔවුන්ගෙන් රු.6,897,507 ක් වටිනා ණයගැතියන් 14 ක් පමණක් සමාගමේ ශේෂයන් සමඟ එකඟ වී තිබුණි. | සටහන්කර ගන්නා ලදී. කෙසේවුව ද, ණයගැතියන් කිහිප දෙනෙක් පමණක් ප්‍රතිචාර දැක්වුව ද, මෙම තත්ත්වය අපගේ පාලනයෙන් තොරය. ශේෂ සනාථ කිරීම් සඳහා යවන ලද ලිපිවලට ප්‍රතිචාර නොදක්වා තිබුණ ද (එකඟ වූ හෝ එකඟ නොවූ), 2019 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු ශේෂ රාශියක් 2020 අගෝස්තු 06 දින වන විට පියවා ඇත. | ණයගැතියන්ගේ ශේෂ තහවුරු කරගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නොමිලේ නිකුත්කිරීම් ලෙස වාර්තා කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂය තුළ විවිධ පාර්ශවයන්ට නොමිලේ නිකුත්කරන ලද පුවත්පත් පිරිවැය රු.112,726,927 ක් විකුණුම් පිරිවැය සහ අලෙවිකරණ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | අලෙවිකරණ වියදම් - නොමිලේ නිකුත්කරන ලද පුවත්පත් යටතේ නොමිලේ නිකුත් කළ පිටපත් ගණන පෙන්වා ඇත. | නොමිලේ නිකුත් කරන ලද පුවත්පත් විකුණුම් පිරිවැය සහ අලෙවිකරන වියදම් ලෙස නොව නොමිලේ නිකුත්කිරීම් ලෙස ගිණුම්ගත කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) බැංකු ගිණුමකට ලද රු.324,182 ක මුදල් ඇණවුම් අසූ හතක් වසර 4 සිට 12 දක්වා උපලබ්ධි නොවී හිඟව පැවතුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසාන වනතෙක් මෙම වටිනාකම හඳුනාගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ඉහත හිඟ මුදල පියවන ලෙස 2018 ඔක්තෝබර් 15 දින ලංකා බැංකු ලේක්හවුස් ශාඛාවෙන් අප විසින් ඉල්ලා ඇත. කෙසේ වුවද මෙදින තෙක් ඒ සඳහා බැංකුව පිළිතුරු සපයා නැත. | ප්‍රමාදයකින් තොරව හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) සමාගම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා සහ මහජනතාවට සමාගමේ ප්‍රකාශන සඳහා ග්‍රාහක මුදල් ගෙවීමට ඉඩ දී තිබුණි. කෙසේවුව ද, 2019 දෙසැම්බර් 31 දිනට ග්‍රාහක ගිණුමේ දක්වන ලද හිඟ ශේෂය රු.8,085,027 ක් විය. ඉන්, රු.4,505,184 ක් වසර 1 සිට 8 දක්වා හිඟව පැවතුණි. කෙසේවුවද, සමාලෝචිත වර්ෂය අවසානය වන විට ද, මෙම වටිනාකම අයකර ගැනීමට කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නව පරිගණක පද්ධතිය හඳුන්වා දීමත් සමග ග්‍රාහකයන් පුද්ගලික, පෞද්ගලික අංශය සහ රාජ්‍ය අංශය වශයෙන් වර්ගීකරණය කරන ලදී. තනි පුද්ගලයන්ට සහ පෞද්ගලික අංශ ග්‍රාහකයන්ට ණයට නොදෙන ලෙස ග්‍රාහක අංශයේ අදාළ නිලධාරීන්ට දැඩි උපදෙස් ලබා දී තිබුණි. රාජ්‍ය අංශයේ ග්‍රාහකයන්ට පමණක් ණයට ලබාගැනීමට ඉඩ දී ඇත. | හිඟ ශේෂ අයකර ගැනීමට නොපමාව ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) අදාළ සේවකයන් විශ්‍රාම යාම, සේවය අවසන් කිරීම හෝ මියයාම නිසා අදාළ සේවකයන් සමාගමෙන් ඉවත්වීම හේතුවෙන් සේවකයන්ගෙන් ලැබිය යුතු වශයෙන් දැක්වූ, එකතුව රු.6,540,785 ක් වසර 1 සිට 11 ට වඩා ඇපකරුවන්ගෙන් අයකර නොගෙන හිඟව පැවතුණි. | විශ්‍රාම යාම, සේවය අවසන් කිරීම හෝ මියයාම හේතුවෙන් දැනටමත් ඉවත් වූ සේවකයන්ගෙන් මෙම ලැබිය යුතු ශේෂය නියෝජනය වෙයි. | ඇපකරුවන්ගෙන් හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 7.4.1 වගන්තිය. | විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් විධායක නොවන අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් හා භාණ්ඩාගාර නියෝජිතයෙකු හෝ මූල්‍ය කළමනාකරණ කුසලතා දරන පුද්ගලයෙකුගේ සභාපතිත්වයෙන් යුතුව රැස්විය යුතුය. කෙසේවුවද, රැස්වීම් සඳහා භාණ්ඩාගාර නියෝජිතයෙක් සහභාගි වී නොතිබුණු අතර විධායක අධ්‍යක්ෂවරයෙක් සභාපතිත්වය දරා තිබුණි. විගණන හා කළමනාකරණ කමිටුව අවම වශයෙන් මාස තුනකට වරක්වත් ක්‍රමාණුකූලව රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී කමිටු රැස්වීම් තුනක් පමණක් පවත්වා තිබුණි. | සටහන් කර ගන්නා ලද අතර 2020 වසරේදි මෙය නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. | චක්‍රලේඛ විධි විධාන ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටුව පැවැත්විය යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය. | සමාගමේ බඳවා ගැනීම් හා උසස්වීම් යෝජනා ක්‍රමය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ එකඟත්වය ලබාගෙන නොතිබුණි. | රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ප්‍රකාශයට පත් කරන ලද ලේඛණය අනුව ඒඑන්සීඑල් එකී දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතට නොවැටේ. එබැවින්, ඒඑන්සීඑල් හට ගිවිසුම්ගත චක්‍රලේඛ අදාළ නොවේ. | චක්‍රලේඛ විධි විධාන පිළිපැදිය යුතුය. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 12 හි 9.4 වගන්තිය. | සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ නිලධාරීන් හත් දෙනෙකු වෙනත් රජයේ ආයතනවලට මුදාහැර තිබුණු අතර ඔවුන්ගේ වැටුප්, වේතන සහ දීමනා ලෙස සමාගම රු.8,825,211 ක් වැයකර තිබුණි. පුවත්පත් කලාවේදීන් නව දෙනෙකු සහ කර්තෘවරු හතර දෙනෙකු මුදාහැරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය තුළ පුවත්පත් කලාවේදීන් විසි හය දෙනෙකු සහ කර්තෘවරු විසිතුන් දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත අලුතින් බඳවාගෙන තිබුණි. | චක්‍රලේඛ විධි විධාන පිළිපැදිය යුතුය | |

| | | | |
|---|---|---|---|
| (ඇ) 2015 ජුනි 17 දිනැති අංක පීඊඩී 3/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | සමාගම රජයට අයත් ව්‍යවසායක් බවට වර්ගීකරණය කර තිබුණි. කෙසේවුවද, සමාගම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද නියෝග අනුගමනය කර නොතිබුණි. | පිළිතුරක් ලබා දී නොමැත. | චක්‍රලේඛ විධි විධාන පිළිපැදිය යුතුය. |
| (ඉ) 1973 අගෝස්තු 04 දිනැති අංක 71/1 දරන ශ්‍රී ලංකා ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද සමාගමේ ව්‍යවස්ථාවලියේ දෙවන උපලේඛනයේ 23 වන වගන්තිය. | 2017 ජුනි 06 දින පිළියෙල කරන ලද සේවක ලැයිස්තුවට 2020 ජුනි 20 දින වන විටත් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. සේවක ලැයිස්තුවට අනුව සාමාන්‍ය සහ කර්තෘ මණ්ඩල දෙපාර්තමේන්තු සේවක සංඛ්‍යාව පිළිවෙලින් 658 ක් සහ 327 ක් වශයෙන් මුළු සේවක සංඛ්‍යාව එකතුව 985 ක් විය. කෙසේවුවද, සාමාන්‍ය සහ කර්තෘ මණ්ඩල දෙපාර්තමේත්තු තත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙලින් 1048 ක් සහ 543 ක් වශයෙන් එකතුව 1591 ක් විය. එම නිසා අතිරික්ත සේවක සංඛ්‍යාව 606 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 දිනට ඉන් සේවකයන් 505 ක් කොන්ත්‍රාත් පදනමින් විය. සමාලෝචිත වර්ෂය තුළ දී සහ පසුගිය වර්ෂය තුළ දී ආදායමේ ප්‍රතිශතයක් ලෙස සේවක පිරිවැය පිළිවෙලින් සියයට 53 ක් සහ සියයට 48 ක් ලෙස දැක්වුණි. | සැලසුම් කරන ලද හෝ ක්‍රියාත්මකව පවතින (ඊආර්පී, අලෙවි, අයිටී පද්ධති, ජාල වැඩි දියුණු කිරීම්, එච්ආර්අයිඑස් පද්ධති ආදී දෑ) ස්වයංක්‍රීයකරණයෙන් සහ පද්ධතීන්ගෙන් උද්ගතවන කාර්යක්ෂමතාවයන් සැලකිල්ලට ගැනීමෙන් සහ ලේක්හවුස් සඳහා පවතින උපක්‍රමික සැලැස්ම පදනම් කරගෙන මෙම සේවක ලැයිස්තුව පිළියෙල කරන ලදී. | සේවක ලැයිස්තුව සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.216,105,000 ක පාඩුවක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.166,227,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.49,878,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට සමාලෝචිත වර්ෂය තුළ පරිපාලන වියදම් සහ මූල්‍ය වියදම් ඉහළයාම ප්‍රධාන හේතු වී තිබුණි.

පසුගිය වර්ෂ හතර සහ සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵල සැලකිල්ලට ගැනීමේ දී, 2015 සිට 2019 දක්වා අගය එකතුවීම උච්චාවචනය වී තිබුණි. කෙසේවුවද, සේවක වැටුප්, බදු හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු (ලාභාංශ සහ සාධාරණ අගය ගැළපීමට පෙර) 2018 වර්ෂයේ සියයට සෘණාත්මක 13 ට සාපේක්ෂව 2019 වර්ෂයේ දී සියයට 14 ක වැඩිවීමක් පෙන්නුම් කරමින් අගය එකතුවීම පිළිවෙලින් රු.1,756,556,000 සහ රු.2,002,031,000 ක් විය.

### 2.2 අනුපාත විශ්ලේෂණය

------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ .

| | 2019<br>ප්‍රතිශතය | 2018<br>ප්‍රතිශතය |
|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 47.02 | 44.33 |
| ලකුණු කළ ලාභය (විකුණුම් පිරිවැය මත දළ ලාභය) | 88.75 | 79.63 |
| පිරිවැටුම මත පරිපාලන පිරිවැය | 44.89 | 38.81 |
| පිරිවැටුම මත විකුණුම් හා බෙදාහැරීම් පිරිවැය | 12.28 | 12.25 |
| පිරිවැටුම මත මූල්‍ය පිරිවැය | 3.47 | 2.54 |
| ජංගම අනුපාතය | 1.51 | 1.59 |
| ක්ෂණික අනුපාතය | 1.03 | 0.89 |
| යෙදවූ ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය | (23) | (23) |
| තෝලන අනුපාතය | 19 | 14 |

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ දළ ලාභ ආන්තිකය හා ලකුණු කළ ලාභය පිළිවෙලින් සියයට 2.69 කින් හා සියයට 9.12 කින් වැඩි වී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී පිරිවැටුම මත පරිපාලන පිරිවැය සියයට 6.08 කින් වැඩි වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දින වනවිට රු.10,481,557 ක් වටිනා අගරු චෙක්පත් 154 ක් විය. ඉන් රු.1,650,214 ක් වටිනා චෙක්පත් 57 ක් සහ රු.693,291 ක් වටිනා චෙක්පත් 12 ක් පිළිවෙලින් වසර 5 ට සහ වසර 3 ට වඩා හිගව පැවතුණු අතර හිඟ ශේෂ අයකර ගැනීම සඳහා ණයගැතියන්ට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. අගරු චෙක්පත් අඩුකිරීම සඳහා අප ණය පාලනය සහ අයකර ගැනීමේ ක්‍රියාවලිය දැඩි කිරීමේ ක්‍රියාවලියක නිරත වී සිටින අතර හිග අගරු චෙක්පත් ශේෂයන් අයකර ගැනීමේ ස්ථාවර පටිපාටීන් අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි. | ප්‍රමාදයකින් තොරව හිඟ මුදල් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ආ) සමාගම කොටස් 1200 ක් මිලදී ගැනීම සඳහා 2008 දෙසැම්බර් රු.1,200,000 ක් අතුරු ගෙවීමක් ලෙස ලංකා පුවත් සමාගම - ශ්‍රී ලංකාවේ ජාතික පුවත් නියෝජිතායතනයට ගෙවා තිබුණ | සටහන් කර ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩල තීරණ එල්කේපීබී 202.17 පදනම් කරගෙන ජ්එන්සීඑල්, ලංකා පුවත් සමාගමේ කොටස් 1200 ක ආයෝජනය කර තිබුණි. 2018 වසරේදී සේවකයන් දෙදෙනෙක් ඒ | ආයෝජනයෙන් ලැබිය හැකි ප්‍රතිලාභ විශ්ලේෂණය කර ආයෝජනය සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| ද, 2019 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රතිලාභයක් ලැබී නොතිබුණි. තවද, 2017 දී ලංකා පුවත් සමාගමේ සේවකයන් තිදෙනෙකුට වැටුප් සහ වේතන ලෙස ගෙවූ රු.2,194,637 ක් අයකර ගැනීමකින් තොරව 2019 දෙසැම්බර් 31 දින වනවිටත් ලැබිය යුතු ලෙස පෙන්වා තිබුණි. | වන විටත් ඉවත් වී තිබුණු අතර එක් සේවකයෙක් ඒඑන්සීඑල් සේවක ලැයිස්තුවට එකතු වී තිබුණි. නවතම ගැසට් දැන්වීමෙන් (2020 අගෝස්තු 10) මෙම ආයතනය මාධ්‍ය අමාත්‍යාංශය යටතේ ගැසට් කර තිබුණි. | |
| (ඇ) සමාගමේ නිලධාරියෙක් අදාළ ආධාරක ලියකියවිලි අස්ථානගත කිරීම හේතුවෙන් දින 720 ට වඩා හිඟව පැවති එකතුව රු.4,552,559 ක් වූ ණය අයකර ගැනීම සඳහා ණයගැතියන් හතර දෙනෙකුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට සමාගම අසමත්ව තිබුණි. කෙසේවුව ද, 2020 ජූලි 31 දින වන විටත්, කළමනාකරණය එම නිලධාරියාට විරුද්ධව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සටහන් කර ගන්නා ලදී. අදාළ දෙපාර්තමේන්තුවේ ආධාරක ලියකියවිලි නොතිබීම හේතුවෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. නිවැරදි කිරීමට සහ මෙවැනි දෑ ඉදිරියේදි සිදුනොවීමට පියවර ගෙන ඇත. | ලියකියවිලිවල භාරකාරත්වය පිළිබඳව වගකීම් නිශ්චය කළයුතු අතර වගකිවයුතු පාර්ශවයන්ගෙන් හිඟ ශේෂ අයකර ගැනීමට වහාම ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) 2014 වසරේ දි සමාගම "බුදුසරණ" වාර සඟරාවේ පිටපත් 192,665 ක් දිවි නැගුම දෙපාර්තමේන්තුවට නිකුත්කර තිබුණු අතර එම පිටපත්වල වටිනාකම රු.2,209,560 ක් විය. අයකර ගැනීම සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් නොගෙන 2015 සිට 2019 දෙසැම්බර් 31 දින තෙක් අඩමාන වෙළඳ ණයගැතියන් සඳහා සම්පූර්ණ වෙන්කිරීම් සිදුකර තිබුණි. | දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරයා ගෙන් ශේෂය අය කරගැනීමට ඒඑන්සීඑල් හිටපු පිරිස් කළමනාකරණය විසින් උත්සාහයන් කිහිපයක් ගෙන තිබුණු අතර ඉතිරි ශේෂය පියවීම කඩිනම් කිරීම සඳහා හිටපු ඇමතිතුමාගෙන් ද ඉල්ලීමක් කර තිබුණි. | ප්‍රමාදයකින් තොරව හිඟ ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) 2019 දෙසැම්බර් 31 දින වන විට සමාගමට එදිරිව අපහාස නඩු 15 ක් පැවති අතර නඩුව කැඳවන අවස්ථාවේදී උසාවියේ වග උත්තරකරුවන් සහ සමාගමේ නීතිඥවරයා පෙනී නොසිටීම හේතුවෙන් එක් අපහාස නඩුවක් සඳහා කොළඹ දිස්ත්‍රික් උසාවිය රු. මිලියන 500 ක් ගෙවන ලෙස නියෝග කර තිබුණි. සමාගම | ඉහත ඒක පාර්ශවීය තීන්දුව අහෝසි කිරීම සඳහා සිවිල් අභියාචනයක් ඉදිරිපත් කර තිබුණි. නමුත් එම අභියාචනය ද අභියාචනාධිකරණය විසින් ප්‍රතික්ෂේප කර තිබුණි. සඳහන් කරන ලද සහනය බලාපොරොත්තුවෙන් මෙම නඩුව මේ වනවිට ශ්‍රේෂ්ඨාධිකරණයේ ඇසීමට නියමිතව ඇත. මෙම නඩුව අවසානයකට ළඟාවී නොමැති | සමාගමට එදිරිව පවතින අපහාස නඩු අවමකර ගැනීමට සමාගම කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| මෙම තීන්දුවට එරෙහිව දිස්ත්‍රික් උසාවියේ සහ සිවිල් අභියාචන මහාධිකරණයේ පෙත්සම් ගොනුකර තිබුණ ද, පෙත්සම් දෙකම ප්‍රතික්ෂේප වී තිබුණි. අනතුරුව, 2019 අගෝස්තු 30 දින දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ තීරණ අංක එෆ් 104.19 මගින් ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කිරීමට තීරණය කර තිබුණි. ඒ අනුව නීති ගාස්තු ලෙස 2019 ඔක්තෝබර් 09 දින රු.18,230,000 ක් නීතිඥවරුන්ට ගෙවා තිබුණු අතර නීතිඥවරුන් තෝරාගැනීම උසාවියේ පෙනී නොසිටි නීතිඥවරයා විසින්ම සිදුකර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණි. තවද, මෙම නීතිඥවරයා 2020 අප්‍රේල් 08 දින විශ්‍රාම ගොස් තිබුණු අතර 2020 මැයි 15 දින කොන්ත්‍රාත් පදනම මත නැවත බඳවාගෙන තිබුණි. | බැවින් සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුව ඇසීම අවසාන වන තෙක් දිස්ත්‍රික් උසාවියෙන් දෙන ලද ඒකපාක්ෂික තීන්දුව ක්‍රියාත්මක කළ නොහැකිය. එම නිසා, ඒඑන්සීඑල් විසින් සමාගමේ නීතිඥයාට වෘත්තීමය වශයෙන් නොසැලකිලිමත්බව මත විනය පරීක්ෂණ පැවැත්වීම පිළිබඳව නිගමනය කිරීමට මම අසමත් වෙමි. 2020 මාර්තු 11 දින සිට ව්‍යාප්ත වූ කොවිඩ් 19 හි පැතිරුණු තත්ත්වය හේතුවෙන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉහත දිගුව ලබාදීම අනිවාර්යය වූ අතර අදාළ ලියකියවිලි පිළිබද අවබෝධයක් ඇති එකම පුද්ගලයා ඇය බැවින් යම් හෙයකින් සමාගම ඇයගේ සේවය දිගුවකින් තොරව කෙටි කාලයකින් අවසන් කළේ නම්, කළමනාකරණය සහ අධ්‍යක්ෂ මණ්ඩලයත් විශාල අපහසුතාවයකට පත් වීමට ඉඩ තිබුණි. ඉහත තනතුර සඳහා අනුප්‍රාප්තිකයෙක් සොයාගැනීම සඳහා සමාගම පියවර ගෙන තිබුණි. |

**3.2 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1985 දී අක්කර 8 න් යුක්තව රු.3,800,000 ක පිරිවැයකින් මිල දී ගත් හෝකන්දර පිහිටි ඉඩමක් 1985 වර්ෂයේ සිටම නිෂ්කාර්යව පැවතුණි. මෙම ඉඩම කොමර්ෂල් බැංකුවෙන් රු.195,000,000 ක ණය පහසුකමක් ලබාගැනීම සඳහා සුරක්ෂිතයක් ලෙස තබා තිබුණි. | සටහන් කර ගන්නා ලදී. 2013 වර්ෂයේ දී ලේක්හවුස් ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් සමාගමෙන් හෝකන්දර ඉඩමේ අයිතිය ඒඑන්සීඑල් වෙත පවරාගෙන ඇති අතර වීආර්එස් සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා 2016 වසරේදී කොමර්ෂල් බැංකුවෙන් ණය ලබාගැනීමට උකස් කර ඇත. | සමාගම වත්කම් සමාගමේ යහපත සඳහා උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |

**3.3** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **2017 වර්ෂයේ උපදේශකයෙකුට රු.2,250,000 ක් ගෙවමින් නිපුණතා ළගාකර ගැනීම, උසස්කිරීම, නිවාඩු ප්‍රතිපත්තිය සහ කාර්යසාධන කළමනාකරණය ආදී වශයෙන් ප්‍රතිපත්ති හතක් පිළියෙල කර සමාගම විසින් භාවිතා කළ ද 2019 දෙසැම්බර් 31 දිනට කාර්යසාධන කළමනාකරණ ප්‍රතිපත්තියට පමණක් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි.** | **ප්‍රතිපත්ති හතෙන් ''කාර්යසාධන''කළමනාකරණ'' ප්‍රතිපත්තියට පමණක් අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබා දී තිබුණි. තවද, අනුමත නොවූ ප්‍රතිපත්ති එච්ආර් දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කරමින් සිටී. වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය මෙම ප්‍රතිපත්ති පිළිබඳව දැනුවත්ව සිටින අතර මෙම ප්‍රතිපත්ති පිළිබඳව ප්‍රමාණවත් අධ්‍යයනයකින් පසුව ඉදිරියේදී අනුමැතිය ලබාදෙන බවට අධ්‍යක්ෂ මණ්ඩලය දැනුම් දී ඇත.** | **සියළුම ප්‍රතිපත්තීන්ට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.** |